# කළුතර ගොළුබෙල්ලන් වඳකිරීමේ අන්දම.

# Control of the Kalutara Snail.

---

( එච්. ඩබ්ලියු. රොස් බර්ට්‍රම් මහතා )

මැඩගස්කර් දිවයිනෙන් බෝවුන මේ ගොළුබෙලි වසංගතය පහතරට තෙත් දෙශ ගුණය පවත්නා ප්‍රදෙශයන්හි පැතිර ගොස් තිබේ. උඩරට පළාත් කීපයකත් එය පැතිර යනබව පෙනේ.

එලවළු වතුවලට හා මල්වතුවලට මේ සතුන්ගෙන් මහත් අලාභ හානි පැමිණෙත්. දැනට අවුරුදු කීපයක් වේලේ සිට ඇතැම් වතුවල වනාන්තරණ අඹුකොළ පෝර වර්ගවලට හා ආවරණය සඳහා වවා තිබෙන පැලෑටි වර්ගවලටද එයින් මහත් විපත්ති සිදුවී තිබේ. මීට අවුරුදු දෙකකට පෙර මේ වත්ත සම්පූර්ණයෙන්ම විග්නා නම් මෑ වර්ගයට අයත් වැල් වලින් ලක්‍ෂණ ලෙස වැවී තිබුණේය. නමුත් දැන් ඒ වැස්ම සම්පූර්ණයෙන්ම විනාශවී තිබේ. 1927තේ අවුරුද්ද මුළුල්ලේම වත්තේ වැඩකරණ ලමයින් හැමදෙනාම උදේ පෙරේට්ටුවට ආවේලේ පටන් දවසකට පැයක් හෝ දෙකක් ගොළුබෙල්ලන් එක්කාසු කිරීමේ වැඩට යවනු ලැබුවෝය. මේ අන්දමෙන් ඒ අවුරුද්ද ඇතුලතදී පැය 9,000ක් පමණ ගොළුබෙල්ලන් එක්කාසු කිරීමේ වැඩට එමණක් ගතවිය. මේ සතුන්ගෙන් සිදුවේගනආ උපද්‍රවය වලක්වා ගැනීමට නොහැකි බැව් අවුරුද්ද අවශානයේදී දැනගන්නාලදුව ගොළුබෙල්ලන් එකතු කිරීමේ වැඩ නවත්වනලදී.

රබර් වතුවල පොලොව සේදීයාම මගහරවා ගැනීමට යොදනලද එකම ප්‍රතිකර්මය ගොළුබෙලි වසංගතය කරණකොටගෙණ සම්පූර්ණයෙන්ම නැතිවේගන යන බැව් කෘෂි කර්ම දෙපාර්තමේන්තුවට දන්වා මේ උපද්‍රවය මැඩ පැවැත්වීමට මැඩගැස්කර් දිවයිනේ කරනුලබන්නේ කුමක්දැයි සොයා දැනගැනීමට දෙපාර්තමේන්තුවෙන් අයදුම් කරනලද්දේය. ගොළුබෙලි වසංගතය මැඩපැවැත්වීමට ඒ රටේ මේ තාක් යොදනලද ප්‍රතිකර්මය නම් උන් කා විනාශකරන විශාල ගස් ගෙම්බන් වර්ගයක් බෝකිරීමයි. ඒ බව වාර්තාකර තිබෙන නමුත් කෘෂි කර්මාධ්‍යක්‍ෂතුමා උන් මෙරටට ගෙන්වීමට වැඩි සතුටක් නොදක්වනලදී.

එක්තරා කණාමැදිරි වර්ගයක දලඹුවන්ගෙන් ගොළුබෙල්ලන් විනාශවෙනබව පේරාදෙනියේදී මීට පෙර වතාවකදී දැනගන්නාලදී. කැලෑ කුකුළෝද මූන් කා දමත්. නමුත් අවාසනාවකට මෙන් මේ පක්‍ෂි වර්ගය පහසුවෙන් සොයාගතනොහැක. එක් වතාවක් මම රජාලියෙකුට වෙඩි තැබුවෙමි. උගේ බොක්ක ගොළුබෙල්ලන් ගෙන් පිරී තිබුණේය.

1927තේ අවුරුද්දේදී ගොළුබෙල්ලන් වඳකිරීමට "පැරිස් ග්‍රීන්" නම් මිශ්‍රය දිය කළ මිශ්‍රණයකට අළු හෝ හුණු යෙදීමෙන් අත්හදා බැලීමක් කරනලදී. නමුත් එයින් සිදුවූයේ විග්නා නම් මෑ වර්ගයේ පැළ මැරීයාම පමණකි. ගොළුබෙල්ලන් වඳකිරීමට එයින් පිහිටක් නොලැබුනේය. තඹ මිශ්‍ර සැර බෙහෙත් වතුරක් (ආර්සැනයිට්න් ඔෆ් කොපර්) ඉසීමෙන්ද අත්හදා බලනලද නමුත් ගොළුබෙල්ලන් කඩිසරව ක්‍රියාකල කාලයකදී තද වර්‍ෂාවෙන් මේ වතුර කොළවිලින් සේදීයන බැව් පෙනී ගියේය.

ගොළු බෙල්ලන් විශෙෂයෙන්ම හුණුවලට කැමති බැව් දැනගන්නාලදී. එසේ වීමට හේතුව උන්ගේ පිටකටුවලට ආධාරයක් වීමයි. නමුත් මේ රටේ පස්වල හුණු පස වැඩි වශයෙන් සම්භ නොවේ. මේ ගොළුබෙල්ලෝ මැරිච්ච ගොළුබෙල්ලන්ගේ කටු පවා කත්. ඇමක් වශයෙන් හුණු දමා විෂ වර්ගයක් යෙදියහැකි බැව් මෙයින් පෙනීගිය නිසා මේ අවුරුද්දේ අප්‍රියෙල් මාසේ සිට ඒ ක්‍රමය අත්හදා බලනලදී. "බේරියම් සල්පේට්" සහ "ලෙඩ් ක්‍රොමේට්" ආදී විෂ වර්ග යෙදීමට කල්පනා කරනලද නමුත් පළමුවෙන් පාසානන් ලෝහ (ආර්සැනික්) යෙදීමට නිශ්වය කර ගන්නාලදී. මැයි මාසේදී ආර්සැනික් ලොකු තොගයක් ලැබුණේය. පළමුවෙන්

පවත්වනලද අත්හදා බැලීමට හුණු වතුර ගැලුන් පහ බැගින් ආර්සැනික් අවුන්ස 2කට 4කට සහ 8ටක අනුක්‍රමයෙන් මිශ්‍රකොට ගොළුබෙල්ලන් ගෙන් ගහනවූ ප්‍රදේශයන්හි තිබුණ ගල්වල අතුල්ලන ලද්දේය. මෙයින් ගොළුබෙල්ලන් විසා දෙනෙක් මැරී තිබුණේය. ඊට පසු "ආර්සනයිට් ඔෆ් ලයිම්" නම් මිශ්‍රණය යෙදීමෙන් තරමක් දුරට ගොළුබෙල්ලන් නැතිකරගත හැකිවිය.

ඊට පසු "ආර් සැනික් ඔෆ් සෝඩා" මිශ්‍රණය එක් එක් ප්‍රමාණයට යොදනලදී "ඇට්ලස්" නම් බෙහෙත් වර්ගය ගෙන්වා තිබුණ ලීහැජස් සමාගමට ස්තුතිවේවා! ඝන ලෙස සාදනලද හුණු වතුර ගැලුන් 4කට හෝ 5කට 'ඇට්ලස්" බෙහෙත් වර්ගය පයින්ට්ටුවක් මිශ්‍රකිරීමෙන් විනාශදායක මිශ්‍රණයක් උපදවාගත හැකිවිය. මේ මිශ්‍රණ යොදනලද ස්ථානයන්හි ගොළුබෙල්ලන් බොහෝ ගණනක් මැරී සිටියාහ. තවත් බොහෝදෙනෙක් "ටැරස්" පාත්තිවලට බඩගාගෙන ගොස් ඒවායේ මැරී ගියෝය. වත්ත හාත්පස තිබෙන ගල් හා ටැරස් පාත්තිවල මේ මිශ්‍රනය ඉසීමෙන් ඉහතින් ගොළුබෙල්ලන් ගෙන් ගහනවී තිබුණ ස්ථානවල දූන් උන් දකින්ට ලැබෙන්නේ කලාතුරකිනි.

හුණු රාත්තල් 20ක් වතුර ගැලුන් 5ක දියකර ඊට පුස් කාපු හාල්වලින් උකු වට උයනලද කැඳ එකතුකළ යුතුයි. ටැරස් පාත්තිවල හා ගල්වල අඩි 5හෙන් පහට මේ මිශ්‍රණයෙන් ස්වල්පයක් ඝන ලෙස ඇතිල්ලීම සාමාන්‍යයෙන් කළහැකි ක්‍රමයකි. හැකිවූ අවස්ථාවලදී වැස්සට නොතෙමෙනසේ තෙරු තිබෙන ගල්වල යටපැත්තේ මිශ්‍රනය ඇතිල්ලිය යුතුයි. වතුවලදී පරණ උළු කැබලිවල හා වලන් කැබලිවල එය ආලේප කළහැක.

**මේ මිශ්‍රණය පැළෑටිවලටද විෂවේ.**

"ඇට්ලස්" බෙහෙත් වර්ගය එක කොටසක් වතුර කොටස් 3ක් සමග මිශ්‍රකොට ගොළුබෙල්ලන්ගේ පරණ කටු කැබලිවලගා විසුරුවා දැමීමෙන් ගොළුබෙලි පැටවුන් බොහෝදෙනෙක් විනාශවෙත්. නමුත් මෙය ලොකු වතුවල පහසුවෙන් කළ නොහැක.

අළුත් හුණු මිශ්‍රණයට වාතය එකතුවීමෙන් අංගාරියට අඩු වශයෙන්වත් නැරෙන්තුරු ගොළුබෙල්ලෝ එය නොකත්. මේ මිශ්‍රණය සම්පාදනය කිරීමට හා ගෑමටත් අක්කරයකට රුපියල් 2/50ක් වියදම්වේ.